# ගුවන්විදුලිය, සමාජ මෙහෙවර සහ අනාගත අපේක්ෂා

මහාචාර්ය සේන නානායක්කාර

ගුවන්විදුලිය මාධ්‍ය විෂයයෙහිලා බලධාරීන්ගේ දැඩි අවධානය යොමුකෙරෙන කටයුත්තක් පිළිබඳ විශ්වාශදායක ආරංචි මාත්‍රයක් අප සවන් වැකිණි. එනම්, ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යය හා සම්බන්ධ කොටගත් සකල විධ නිර්මාණ හා නිර්මාණශිල්පීන්, කලාකරුවන් ඇගයෙන වාර්ෂික රාජ්‍ය සම්මාන උළෙලක් පිළිබඳ ආස්වාදජනක ආරංචියයි. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංවිධාන කරනු ලබන මේ වැඩසටහන ලබන වසරේ සිට (2017) සෑම වසරකම ලෝක ගුවන්විදුලි දිනය සමරන පෙබරවාරි 13 වෙනිදා නිශ්චිතවම පැවැත්විය යුතු බවට ද යෝජනා පැමිණ තිබේ.

දැනට මේ වනවිට ශ්‍රී ලංකාවේ සිනමාවට, රූපවාහිනියට, පුවත්පතට හා වේදිකාවට අදාළ සියලු ක්ෂේත්‍රයන් සඳහා රාජ්‍ය හා පෞද්ගලික මට්ටමේ විවිධ සම්මාන උළෙල ක්‍රියාත්මක වුව ද, ගුවන්විදුලි මාධ්‍යය උදෙසා එබඳු තීරණාත්මක ඇගයුම් ක්‍රියාවලියක් දියත් නොවීම බරපතළ අඩුවක්ව පැවතිණි. කලකට පෙර ශ්‍රී ලංකා ජාතික කතෝලික සිනමා පර්ෂදය විසින් සංවිධානය කරන ලද 'OCIC-උන්ඩා' සිනමා සම්මාන උළෙලේ දී වසර කිහිපයක් ගුවන්විදුලි ක්ෂේත්‍රයන් උදෙසා ද සම්මාන කිහිපයක් පිරිනැමුව ද එය ද අද වනවිට නවතා දමා ඇත. එබැවින් මේ වනවිට ගුවන්විදුලිය වූ කලී මේ රටේ ඇගයීම් කර්යාවලියෙන් වියුක්ත මාධ්‍ය ක්ෂේත්‍රයක් ලෙස පවතින්නකි.

වී අනුව, මෙකී මාධ්‍ය උදෙසා සංවිධාන කෙරෙන පුළුල් මට්ටමේ ඇගයීම් ක්‍රියාවලියක් පිළිබඳ ලද ආරංචි මාත්‍රය අප අතිශය අමන්දානන්දයට පත්කරලන්නක් බව අවධාරණය කළ යුතුමය. එබඳු වගකීම් සහිත කාර්යාවලියක බර උර දරන්නට ලැබීමත් භාග්‍යයක් කොට සැලකිය යුතුය.

1924 ජුනි මස 27 වෙනිදා කොළඹ මධ්‍යම විදුලි සංදේශ කාර්යාලයේ සවිකරන ලද කි. වො. 1/2 ක සම්ප්‍රේෂණ යන්ත්‍රයක් මගින් එහි පළමු ප්‍රචාරය සිදු කෙරිණි. ලංකා ඉංජිනේරු සංගමය (The Association of Lanka Engineer) අමතා එවකට

ආණ්ඩුකාරවර 'සර් විලියම් හෙන්රි මැනිං' විසින් නිකුත් කරන ලද පණිවිඩය ලාංකීය ගුවන්විදුලි විකාශයේ ඓතිහාසික සංධිස්ථානයක් වූයේ එලෙසිනි. අත්හදාබැලීම් ලෙස බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනවල පමණක් එහි ක්‍රියාකාරිත්වය සිදු කෙරිණි. පැරණි ග්‍රැම්ෆෝන් යන්ත්‍රයක් ක්‍රියාකර ඒ ඉදිරියේ මෛක්‍රෆෝනයක් තැබීම පමණක් එහිදී සිදුවිය.

පසුව 1925 දෙසැම්බර් මස 16 වෙනි දින එකී සේවාව කිලෝවොට් 1 දක්වා වැඩිකොට, එවකට ආණ්ඩුකාරවර 'සර් හියු ක්ලිෆර්ඩ්ගේ' ප්‍රධානත්වයෙන් විවෘත කරන්නට යෙදිනි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි ප්‍රචාරක මාධ්‍යයේ නිල ආරම්භය ලෙස සැලකෙනුයේ 1925 දෙසැම්බර් මස 16 වෙනිදා ය.

එවකට තැපැල් හා විදුලි සංදේශ ප්‍රධාන ඉංජිනේරුවරයාව කටයුතු කළ බ්‍රිතාන්‍ය ජාතික එඩ්වඩ් හාපර් මහතාත්, තැපැල්පති ලෙස කටයුතු කළ මොරිස් සැල්වඩෝර් ශ්‍රේෂ්තා මහතාත්, ලංකා අධ්‍යාපන අධ්‍යක්ෂව සිටි 'ලොක්ලාන් මැක්රේ' මහතා මෙන්ම 1922දී මෙරට පිහිටුවාගන්නා ලද ලංකා ගුවන්විදුලි සමාජයත් (Lanka Wireless Club) මෙම කටයුත්තේ දී පුරෝගාමී මෙහෙවරක් ඉටු කොට ඇති අතර, බ්‍රිතාන්‍ය ජාතික 'එඩ්වර්ඩ් හාපර්' මහතා ලාංකීය ගුවන්විදුලියේ නිර්මාතෘවරයා ලෙස ඉතිහාසයට එක්විය. එවකට ලාංකීය ඉංජිනේරුවරුන් වන ඒ. නඩරාසා, බෙනට් විජේතිලක හා ඩබ්ලිව් ඊ. ද සිල්වා යන මහත්වරුන්ගේ අද්විතීය දායකත්වය ද මේ සඳහා ලද බවට ඉතිහාසය සාක්ෂි සපයයි.

එසේ ආරම්භ කළ ලාංකීය ගුවන්විදුලියට අද වනවිට අවුරුදු අනූ එකකි. එවකට හිරු නොබසින අධිරාජ්‍යයේ කේන්ද්‍රස්ථානය වූ එංගලන්තයේ ගුවන්විදුලිය අරඹා තෙවසරකටත් පෙර, එකී ගෞරවය හා ජයග්‍රහණය ලද රට ලංකාවයි. අපට පෙර නිදහස ලද ඉන්දියාවේ බොම්බාය ගුවන්විදුලි මධ්‍යස්ථානය පිහිටුවාලුවේද 1927දීය. ඒ අනුව, අප රට ලෝක ගුවන්විදුලි ඉතිහාසයේ අද්විතීය සංධිස්ථානයක් බවට වාර්තා ගතවෙයි. ගතවූ වසර 91ක් තුළ එකී ජයග්‍රහණයේ උද්දාමය අප සමාජ ප්‍රගමනයට ඵලදායක වීද යන්න විමසීම කාලෝචිතය.

අපේ ගුවන්විදුලිය වෙනම ම දෙපාර්තමේන්තුවක් බවට පත්වූයේ 1949 ඔක්තෝබර් 01 වෙනිදාය. එතෙක් කල් විදුලිසංදේශ දෙපාර්තමේන්තුවට අදාළව තැපැල්පතිගේ පාලනය යටතේ පැවති මෙහි ප්‍රථම අධ්‍යක්ෂවරයා වූයේත් බ්‍රිතාන්‍ය ජාතික 'ජෝන් එන්ග ලැම්ප්සන්' මහතා ය. පසුව එම තනතුර අධ්‍යක්ෂ ජනරාල් ලෙස වෙනස් වූ අතර 'ලැම්ප්සන්' ප්‍රතිසංවිධානය ලාංකීය ගුවන්විදුලියේ ප්‍රගමනයට හේතු විය. පසුව ලංකා සිවිල් සේවයේ විශිෂ්ට නිලධාරියකු වූ 'එම්. ජේ පෙරේරා' මහතා ප්‍රථම ලාංකීය අධ්‍යක්ෂජනරාල්වරයා ලෙස පත්වූයේ 1952 දෙසැම්බර් 19 වෙනිදා ය. 1965 පත්කරනු ලැබූ හුළුගල්ල කොමිසමේ නිර්දේශ අනුව, 1967 ජනවාරි මස 02 වෙනිදා ලංකා ගුවන්විදුලිය ව්‍යවස්ථාපිත සංස්ථාවක් බවට පත්විය. සභාපති හා

අධ්‍යක්ෂජනරාල් ලෙස සිවිල් සේවයේ තවත් විශිෂ්ටයකු වූ නෙවිල් ඩී. ජයවීර මහතා පත්කෙරිණි.

ලාංකේය සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික ආදී සියලු ක්ෂේත්‍රයන් කෙරෙහිලා දැඩි බලපෑම් කරන්නටත්, සමස්ත සංවර්ධන ක්‍රියාවලිය කෙරෙහිලා දායකත්වය දක්වන්නටත් ඒ ඒ කාලානුරූපව ගුවන්විදුලියට හැකියාව ලැබිණි. එකී කාර්යයේදී ගුවන්විදුලිය මාධ්‍යයටම සුවිශේෂ වූ ශක්‍යතා අනල්ප බව අපි අත්දැකීමෙන් දනිමු. ක්ෂණික මාධ්‍යයක් ලෙස එකවර සුවිශාල ග්‍රාහක පිරිසක් ඇමතිය හැකිවීමත්,ස්වභාෂාවෙන්ම කෙරෙන කථන මාධ්‍යයක් බැවින් එය භාවිත කිරීම උදෙසා අක්ෂර ඥානයක් හෝ උගත්කමක අවශ්‍යතාවක් නැතිවීමත්, ශ්‍රාවක සවන් සනහාලිය හැකි වඩාත් ආකර්ෂණශීලී විචිත්‍රාංගමය වැඩසටහන් සැකසීමේ හා ප්‍රචාරය කිරීමේ හැකියාවත්, ඊටම සුවිශේෂ වූ සරල තාක්ෂණය හා සාපේක්ෂ ලාභයද ඒ අතර වෙයි. මේ නිසා 1960, 70 හා 80 දශක වනවිට ගුවන්විදුලිය වූ කලී මෙරට ප්‍රධානතම විද්‍යුත් මාධ්‍යය මෙන්ම පොදුජන ග්‍රාහක ප්‍රජාවට සමීපතම ජනමාධ්‍යය විය.

කලාකරුවන්, විද්වතුන්, විවිධ ක්ෂේත්‍රවලට අදාළ විවිධ විශේෂඥයින්, දේශපාලනඥයින් හා සමාජ සේවකයින් මෙන්ම වඩාත් යහපත් වින්දනයක් හා රසිකත්වයක් සහිත ග්‍රාහකයින් පමණක් නොව, සැබෑ මනුෂ්‍යයින් ගොඩනගන්නට එදා මෙදාතුර ගුවන්විදුලිය කළ මෙහෙවර කොපමණ ද? අදට වඩා එය අතීතය හා බැඳුණු ගුවන්විදුලියේ සමාජ සත්කාරක ක්‍රියාවලියක් ලෙස අර්ථකථනය කිරීම නිරවද්‍ය වේ යැයි සිතමි. අපි ඒ සඳහා එක් නිදසුනක් පමණක් ගනිමු.

සරලව සලකා බලන කල අධ්‍යාපනය යනු දැනුම, ආකල්ප හා ජීවන කුසලතා යනාදී පාර්ශවයන්හි පරිපූර්ණභාවයක් ඇති කිරීමයි. යහපත් දැනුම හා ආකල්ප විසින් මානව ජීවිතය නිරවද්‍ය ලෙස ගොඩනැගෙන අතර ජීවන කුසලතාව තුළ එය තහවුරු කෙරෙනු ඇත. එසේ නම්, එබඳු වගකීම් සහිත වැදගත් ක්‍රියාවලියක මුල් හිමිකරුවන් වන රටේ දරු පරපුර සම්බන්ධයෙන් එවක ගුවන්විදුලියෙන් ඉටු කෙරුණු සේවාව අපමණ ය. පසුකාලීනව අපේ රටේ බිහිවූ බොහෝ කලාකරුවෝ, විද්වත්හු ගුවන්විදුලියේ ළමා තීරයෙන් ආභාසය ලැබුවෝ ය. ඩී.එම්. කොළඹගේ සූරීන් ලියූ 'ගුවන්විදුලි වංශය' කෘතියෙන් උපුටා ගැනෙන මේ විස්තරය කියවා බලන්න.

"කලක් ගුවන්විදුලි මාධ්‍ය අධ්‍යක්ෂව සිටි 'රිජ්වේ තිලකරත්න' කුඩා කල නිතර නිතර ළමා තීරයට සහභාගි වූවෙකි. අක්ෂිදාන සංගමයේ දොස්තර හඩ්සන් සිල්වා සතිපතාම පාහේ ළමා තීරයට සහභාගි විය. දොස්තර උපුල් රංජන් විජේවර්ධනගේ නමද නිතර ළමාතීරයෙන් කියැවුණු එකකි. ප්‍රධාන පෙළේ නාට්‍ය නිෂ්පාදකයෙකු මෙන්ම නළුවෙකුද වන හෙන්රි ජයසේන සහ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ

ජනප්‍රිය මනමේ නාට්‍යයේ 'මනමේ' බිසොව හැටියට රඟ පා කීර්තියට පත් ට්‍රිලීෂියා ගුණවර්ධන (අබේකෝන්) ළමා තීරයෙන් නිතර යුග ගී ගැයුවෝ දෙදෙනෙක් වෙති. පසු කලෙක ගුවන්විදුලියේ ළමා හා කාන්තා වැඩසටහන් භාර නිලධාරියා ලෙස කටයුතු කළා වූද, කීර්තිමත් ගීත නිබන්ධකයෙකු හා කවියෙකු වූද කරුණාරත්න අබේසේකර එදා ළමා තීරයේ දීප්තිමත් තරුවක් විය. ගායකයෙකු හා චිත්‍රපට නළුවෙකු වූ ඩබ්ලියු. කේ. (රවීන්ද්‍ර) රූපසේන ළමා තීරයෙන් පුහුණුව ලද්දෙකි. අගනුවර තරුණ කවි සමාජයේ පතාක යෝධයෙකු වූ පණ්ඩිත ප්‍රේමදාස මුළින්ම කවි ලියුවේ ගුවන්විදුලි ළමා තීරයට ය. සුප්‍රසිද්ධ ප්‍රවෘත්ති පත්‍ර කලාවේදියෙකු හා ගීත නිබන්ධකයෙකු වූ ජෝර්ජ් ලෙස්ලි රණසිංහ සිය හපන්කම් පෙන්වීම ආරම්භ කළේ ළමා තීරයෙනි. දක්ෂ ලේඛකයෙකුවූ තලංගම ප්‍රේමදාස කුඩා කඩා සිටම ළමා තීරයට ලිපි සැපයුවේ ය. පසුව ගුවන්විදුලියේ සේවයට බැඳුණු හරබර කවි ලිවීමෙහි සමත් ඩෝල්ටන් අල්විස් සිය හාස්කම් පෙන්වීම ආරම්භ කළේ ළමා තිරයෙනි."

නීතීඥ යූ. ඒ. එස්. පෙරේරා හෙවත් 'සිරි අයියා' මෙහෙයවූ ළමා තීරය පිළිබඳ තලංගම ප්‍රේමදාස කලාකරුවාණන් විසින් කරන ලද ප්‍රකාශයක මුද්‍රිත සටහනක් නැවතත් ගුවන්විදුලි වංශයෙන් උපුටා ගනිමි.

"මා ළමා වැඩසටහන්වලට සහභාගී වූයේ ගුවන්විදුලි කාර්යාලය කොටාරෝඩ්හි පිහිටි කාලයේදී ය. එවිට මගේ වයස අවුරුදු 12ක් පමණ විය.

'මුනි නන්දන සිරිපාදෙ වඳිමි' යන ගීතයේ අනුවාදනය එකල සිරි අයියා මෙහෙයවූ ළමා වැඩසටහන්වල තේමා වාදනය විය. ඒ තේමා වාදනය ඇසෙන විට, අප කොහේ සෙල්ලම් කරමින් සිටියත් ගුවන්විදුලි යන්ත්‍රය කරා දිව ගිය සැටි මට අද මෙන් මතකය. පසුව ළමා තීරය (අනිත් ළමයින්ගේ මෙන්ම) කුඩා මගේ සිත් කොතරම් ඇඳ බැඳ තිබුණේ ද යත් මා ගෙදර සිට සැතපුම් දෙකක් පමණ දුරින් පිහිටි නිවසක ගුවන්විදුලි යන්ත්‍රය කරා ගිය සැටි මට අද මෙන් මතකය. එදා මා ළඟ තිබුණේ කණේ දමාගෙන අසන 'ඉයර්ෆෝන්' සෙට් එකකි. එය පැහැදිලිව නොඇසුන බැවින් ළමා තීරය ප්‍රචාරය වන සෑම දිනකම මම සැතපුම් දෙක පයින්ම ගියේ හුදෙක් 'ළමා තීරය' ඇසීමේ ආසාව නිසාමය. ඇතැම් දිනෙක වේලාව පසුවේදෝ යන බියෙන් දුව ගිය සැටිද මට මතකය. ඒ තේමාවාදනය දැන් වුනත් ඇසෙන විට මට අතීත සිදුවීම් සිහිපත් වේ."

ගුවන්විදුලිය මාධ්‍ය එවක ළමා ජීවිත කෙරෙහි කෙතරම් බලපා තිබිණි ද? එකී බලපෑම රටට යහපත් අනාගත පරපුරක් නිර්මාණය කිරීමෙහිලා දක්වා ඇති දායකත්වය කෙබඳු ද? ඒ තුළින් සිදුකෙරෙන සමාජ සංවර්ධන ක්‍රියාවලිය කෙතරම් සාර්ථකද? යනාදී පුළුල් වශයෙන් අවධානය යොමු කළ යුතු දෘෂ්ටිමය කාරණා රාශියකි. ඉතා අවිචාරවත් ලෙස රූපමාධ්‍යය හිස් මුදුනේ තබාගත් ජනතාවක් වෙසෙන ශ්‍රී ලංකාවේ, අද එබඳු විශිෂ්ට ගුවන්විදුලියක් තිබේ ද? එවැන්නක් තිබෙන්නට හෝ

නොතිබෙන්නට පුළුවන. එය එක් එක් පුද්ගල දෘෂ්ටිකෝණවලට විවිධාකාරයෙන් හසුවන්නකි. එහෙත්, ගුවන්විදුලි මාධ්‍ය වූ කලී අද අත්‍යවශ්‍ය අවධානය නොලබන අවශේෂ මාධ්‍යයක් ගානට වැටී ඇති බව නම් අවිවාදයෙන් පිළිගත යුතු ය.

පසුගිය ජනවාරි 05 වෙනිදාට ලංකා ගුවන්විදුලිය සංස්ථාවක් බවට පත්ව වසර 49 කි. එකී සැමරුම වඩාත් ජයග්‍රාහී ලෙස සමරන්නට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රජරට සේවාව මගින් කටයුතු කෙරිණි. සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්මදේශනාවක් සහ සජීව වැඩසටහන් රැසක් සඳහා කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානය හා ප්‍රාදේශීය සේවාවන් ද එදින රජරටට සම්බන්ධ කෙරිණි. එහිදී පුරා පැයක සජීව වැඩසටහනක් සඳහා මම ද සහභාගි වීමි. නිවේදක ප්‍රසන්න දිසානායක විසින් මෙහෙයවන ලද මේ සොඳුරු හෝරාවෙන් කුළුගැන්වුයේද මේ අද්විතීය මාධ්‍යය අප සමාජ ප්‍රගමනය උදෙසා ගාමක බලවේගයක් වූ අයුරු ය.

එතෙක් කල් කොළඹ සිට රාජ්‍ය නිල නිවේදන හා දුරින් සිට ගෙනා ප්‍රවෘත්ති ඉදිරිපත් කළ ගුවන්විදුලිය සැබෑ ලෙස පොදුජන මාධ්‍යයක් බවට පත්වූයේ ප්‍රාදේශීය සේවා පිහිටුවීමත් සමග බව අපගේ අදහසයි. 1979 අප්‍රේල් මස 12 වෙනිදා පිහිටුවාලූ රජරට සේවය එහි සමාරම්භක කේන්ද්‍රස්ථානය විය. සිරිල් රාජපක්ෂ, ස්වර්ණ ශ්‍රී බණ්ඩාර, විජයානන්ද ජයවීර, ප්‍රේමකීර්ති ද අල්විස්, තිලක සුදර්මන් ද සිල්වා, ජී. ටී. වික්‍රමසිංහ, සේන ගුණසේකර, කුලසේන පොන්සේකා ආදී ගුවන්විදුලිය මාධ්‍යයේ අත්දැකීම් සපිරි, නිර්භීත, යෝධ බලඇණියක රජරට ආගමනය සිදුවූයේ රජරට සේවයත් සමග ය.

ඉන් පෙර කිසිදු ගුවන්විදුලි මධ්‍යස්ථානයකට වැස්සකටවත් ගොඩ වී නොසිටි අප වැනි දුහුනන්ගේ ජීවිත කෙරෙහි එයින් සිදුකෙරුණු බලපෑම අනල්පය. ඒ තුළින් බිහිකෙරුණු සොඳුරු කලාකරුවන් කොතෙක් ද? කවීන්, ගීත රචකයින්, ගායක ගායිකාවන්, නාට්‍ය ශිල්පීන්, සංගීතඥයින්, පිටපත් රචකයින්, නිවේදක නිවේදිකාවන් හා ප්‍රචාරණ ක්ෂේත්‍රයේ නිර්මාණශිල්පීන් දහස් සංඛ්‍යාත ප්‍රමාණයකි. මෙහිදී ඒ එක් එක් ක්ෂේත්‍රයෙහිලා ප්‍රශස්ත ප්‍රවීණතා පසක් කළවුන් නාමාවලියකට ගොනු නොකරනුයේ මෙම ලිපියෙහි සංක්ෂිප්තභාව රකිනු රිසියෙනි. එපමණක් නොව, රජරට සේවය ප්‍රමුඛ ප්‍රාදේශීය සේවාවන් හා මහවැලි ප්‍රජා ගුවන්විදුලි සේවාවන්වලින් සිදුකෙරුණු අනුපමේය සමාජ මෙහෙවර අතිශය ප්‍රශංසා කටයුතු ය. අදාළ ශ්‍රවණ කලාපීය ජනතාවට කාලීන පුවත් පිළිබඳ දැනුම හා අවබෝධය ලබාදීම, ස්වකීය ජීවන තත්ත්වයන් සාර්ථක ලෙස තහවුරු කරගැනීමෙහිලා උපකාරවීම, දෛනික විනෝදාස්වාද සම්පාදනය, උසස් රසවින්දනයක් හා රුචිකත්වයක් ගොඩනගා ගැනීමෙහිලා අදාළ පසුබිම සැකසීම ආදී විවිධ කාර්යභාරයන් ඒ තුළින් ඉටුකෙරිණි.

එහෙත්, අද වනවිට ප්‍රාදේශීය ගුවන්විදුලි මධ්‍යස්ථානවල තත්ත්වය කෙබඳු ද? ප්‍රජා ගුවන්විදුලි මධ්‍යස්ථානවලට සිදුවී ඇත්තේ කුමක්ද? ඊට අදාළව සැපයිය

යුතු ප්‍රතිපාදන හා නඩත්තු කටයුතු කවරාකාරද? යනාදී ප්‍රශ්නකාරී ස්වභාවයන් සුවිශාල අර්බුද දක්වා වර්ධනය වී ඇති බව පෙනේ. කොළඹ ප්‍රධාන ගුවන්විදුලියත්, ප්‍රාදේශීය මධ්‍යස්ථානත් මේ වනවිට මුහුණ දෙන ප්‍රධානතම අභියෝග ත්‍රිත්වයක් මම හඳුනාගතිමි. පළමුවැන්න මූල්‍ය අර්බුදයයි. දෙවැන්න අභ්‍යන්තරික වශයෙන් පවත්නා නිලධාරී අර්බුද හා තෙවැන්න අශ්ලීල දේශපාලන මැදිහත්වීමය. මේ සියල්ල සැබෑ සද්භාවයෙන් යුතුව අපක්ෂපාතීව සාකච්ඡාවට බඳුන්කළ යුතුය.

මේවා නිවැරදි කළ යුතුය. සියල්ල වඳ බැස ඇති කල ගුවන්විදුලිය පමණක් නිවැරදි කළ හැකි ද? යන්න මෙහිදී ඉදිරිපත්විය හැකි තර්කයකි. සත්‍යයකි. එහෙත්, හැකි පරිදි කළ යුතු ය. ඒ සඳහා අවැසි අවධානය රාජ්‍ය පාර්ශවයෙන් හෝ පෞද්ගලික පාර්ශ්වයෙන් හැකි පමණ යොමු කරවා ගත යුතුය.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන රාජ්‍ය සම්මාන උළෙලක අවශ්‍යතාව හා කාලීන වැදගත්කම කුළුගැන්වෙනුයේ මෙහිදීය. ගුවන්විදුලිය මාධ්‍ය වැඩසටහන් සඳහා ආචාරධර්ම පද්ධතියක අවශ්‍යතාව පැනනගින්නේද මෙහිදී ය. ආකෘතිය, අන්තර්ගතය මෙන්ම ඊට අදාළ ශිල්ප ධර්මතාද, එකී වැඩසටහන්වල පශ්චාත් සමාජ බලපෑම්ද එහිදී අවධානයට යොමු කළ යුතු ය. ඒ අනුව ගත් කල මාධ්‍යවේදීන්, නිර්මාණ ශිල්පීන් හා ඒ ඒ ආයතන ප්‍රධානීන් ද එකී ආචාරධර්මීය පදනමකට අනුගත විය යුතුව ඇත.

එබැවින්, ගුවන්විදුලිය මාධ්‍යයෙහිලා පොදුජන අවධානය යොමු කෙරෙන මෙබඳු කාර්යාවලියක අවශ්‍යතාව හා වැදගත්කම අවිවාදිතය. ඒ සඳහා පුරෝගාමීත්වය පළ කරන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවටත්, අධ්‍යක්ෂ අනුෂා ගෝකුළ ප්‍රනාන්දු මහත්මිය ඇතුළු සියලු දායක කාරකාදීන්ටත් අපගේ ප්‍රශංසාව හිමි වියයුතු යැයි අවධාරණය කරමි.